සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - I, II | කාලය පැය 03 යි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

නම/ විභාග අංකය:

## I - කොටස

i. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
ii. 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැලපෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01. ශ්‍රී ලංකාවේ මැතිවරණ කොට්ඨාස බෙදා වෙන් කිරීමේ දී සීමා නිර්ණය සඳහා ගනු ලබන්නේ,
(1) භූමිය පමණි. (2) ජනගහනය පමණි.
(3) භූමිය හා ජනගහනයයි. (4) ජීවත්වන ජනතාවගේ වර්ගවාදී භාවයයි.

02. එක් සමාජයක් තුළ සංස්කෘතීන්ට අයත් ජන කොටස් සාමූහිකව ජීවත් වන්නේ නම් එය සමාජය,
(1) බහු වර්ගික සමාජයක් ලෙස හැඳින්වේ. (2) බහු සංස්කෘතික සමාජයක් ලෙස හැඳින්වේ.
(3) බහු ආගමික සමාජයක් ලෙස හැඳින් වේ. (4) බහු ජාතික සමාජයක් ලෙස හැඳින් වේ.

03. ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටු කර ගැනීම.
(1) ධරණීය සංවර්ධනයයි. (2) සදාචාර සංවර්ධනයයි.
(3) සමාජ සංවර්ධනයයි. (4) පුද්ගල සංවර්ධනයයි.

04. ගැටුම් සම්බන්ධයෙන් දැක්විය හැකි ඉතාම නිවැරදි පිළිතුර තෝරන්න.
(1) ගැටුම් හැම විටම විනාශකාරී වේ.
(2) මිනිසුන් තුළ පවත්නා විවිධත්වය ගැටුම් මගින් නොපෙන්වයි.
(3) කුලය, ආගම, භාෂාව මුල්කර ගෙන ගැටුම් ඇති නොවේ.
(4) සෑම සමාජයකම ගැටුම් ඇති වේ.

05. ශ්‍රී ලංකාවේ නීතිපති තුමා පත්කරනු ලබන්නේ කවුරුන් විසින්ද,
(1) අගමැති විසිනි. (2) ජනාධිපති විසිනි.
(3) අධිකරණ ඇමති විසිනි. (4) අග්‍රවිනිශ්චයකාරවරයා විසිනි.

06. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව මගින්,
(1) ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්විය.
(2) ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් ස්ථාපිත විය.
(3) සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දෙන ලදී.
(4) විධායක ජනාධිපති ධූරයක් ස්ථාපිත කරන ලදී.

07. රජයේ පරිපාලන ක්‍රියාවකින් පුරවැසියකුගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් පැමිණිලි කළහැකි ආයතනය වන්නේ කුමක් ද?
(1) මානව හිමිකම් කොමිෂමයි. (2) ශ්‍රේෂ්ඨාධිකරණයයි.
(3) ඔම්බඩ්ස්මන් ධූරයයි. (4) අභියාචනාධිකරණයයි.

08. ශ්‍රී ලංකාවේ පළාත් සභා සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) පළමු ජනරජ ව්‍යවස්ථාවේ සංශෝධනයක් මගින් පිහිටුවා ඇත.
(2) එහි බලතල ලයිස්තතු 05 ක් යටතේ බෙදාහැර ඇත.
(3) ආණ්ඩුකාරවරයා ඡන්දයෙන් තෝරා ගැනීමට අවස්ථාව සලකා ඇත.
(4) මහ ඇමති ඇතුළුව පස් දෙනෙකුගෙන් යුත් අමාත්‍ය මණ්ඩලයක් ඇත.

09. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක මූලික ලක්ෂණයක් වන්නේ,
   (1) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර ඍජු සම්බන්ධතාවයක් තිබීම.
   (2) බලෙන් ආණ්ඩු පෙරළා දැමීමේ අයිතිය මහජනතාව සතුය.
   (3) ව්‍යවස්ථාදායකය ඉවත් කිරීමට විධායකයට හැකිවීම.
   (4) විධායකය තුළින් ව්‍යවස්ථාදායකය පත්වීම.

10. රටක පාලනය සඳහා සකස් කරගනු ලැබූ ප්‍රතිපත්ති මාලාවත් පදනම් කරගෙන පාලන බලය ලබා ගැනීමේ අරමුණ ඇති ව සංවිධානය වූ පුද්ගල කණ්ඩායම,
   (1) ආණ්ඩුව නමින් හැඳින් වේ.
   (2) දේශපාලන පක්ෂ නමින් හැඳින්වේ.
   (3) විධායකය නමින් හැඳින් වේ.
   (4) ව්‍යවස්ථාදායකය නමින් හැඳින්වේ.

11. රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන ප්‍රධාන හේතුවක් වන්නේ,
   (1) රාජ්‍ය සේවය නිර්දේශපාලනීකරණය වීම.
   (2) රාජ්‍ය පාලකයින් වගකීමෙන් කටයුතු කිරීම.
   (3) රාජ්‍ය පාලනයේ කාර්යක්ෂමතාවය.
   (4) නිලධාරීවාදය ක්‍රියාත්මක වීම.

- **පහතින් දැක්වෙන්නේ මධ්‍යම ආණ්ඩුව සතු බලතල කිහිපයකි. ඒ ඇසුරෙන් පහත අංක 12 සහ 13 ට පිළිතුරු සපයන්න.**

   A - නීති පැනවීම. B - නීති ක්‍රියාත්මක කිරීම.
   C - රාජ්‍ය සේවය පාලනය කිරීම. D - විධායකය පාලනය කිරීම.
   E - විධායකයට අවශ්‍ය බහුතරය සැපයීම. F - විදේශ කටයුතු

12. විධායකයට අයත් කාර්යයන් ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) ABC (2) BCF (3) DCF (4) DEF

13. ව්‍යවස්ථාදායකයට අයත් කාර්යයන් ඇතුළත් පිළිතුර තෝරන්න.
   (1) ABC (2) DCE (3) ADE (4) AEF

14. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948 දෙසැම්බර 10 වන දින සම්මත කරනු ලැබූ ලෝක ඉතිහාසයට වැදගත් ලියවිල්ල වන්නේ,
   (1) ළමා අයිතිවාසිකම් සම්මුතිය. (2) මානව හිමිකම් පිළිබඳව විශ්ව ප්‍රකාශනය.
   (3) සීඩෝ සම්මුතිය. (4) අන්තර් ජාතික මානව හිමිකම් පනත.

15. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියෙකු විසින් ඉටුකළ යුතු නීතිමය යුතුකමක් වන්නේ,
   (1) විශේෂ අවශ්‍යතා ඇති අයට උදව් කිරීම. (2) සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් ආරක්ෂා කිරීම.
   (3) පොදු දේපල ආරක්ෂා කිරීමය. (4) ගුරුවරුනට ගරු කිරීම.

16. මූලික අයිතිවාසිකම් හඳුන්වා දීමත් ඒවා ආරක්ෂා කිරීමට අවශ්‍ය විධි විධාන ඇතුළත් කොට සකස් කර ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කුමක් ද?
   (1) 1947 සෝල්බරි ව්‍යවස්ථාව (2) 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව
   (3) 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (4) 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

17. ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන සාම්ප්‍රදායික ක්‍රමය වන්නේ,
   (1) විනිසීමයි. (2) සාකච්ඡා ක්‍රමයයි. (3) සමථකරණයයි. (4) මැදිහත්කරණයයි.

18. පුද්ගලයාගේ අවශ්‍යතා සහ වුවමනා ඍජුව ඉටුකර ගැනීමට දායක කර ගන්නා භාණ්ඩ හඳුන්වන්නේ,
   (1) අන්තර් භාණ්ඩ නමිනි. (2) ප්‍රාග්ධන භාණ්ඩ නමිනි.
   (3) පාරිභෝගික භාණ්ඩ නිමිනි. (4) ආයෝජන භාණ්ඩ නමිනි.

19. වර්තමානයේ ක්‍රියාත්මක වන නව ලිබරල්වාදී වෙළඳපොල ආර්ථික ක්‍රමයේ ලක්ෂණයක් නොවන පිළිතුරු තෝරන්න.
    (1) රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම.
    (2) පාලන නීතිරීති සහ සීමාවන් දැඩි කිරීම.
    (3) පෞද්ගලික ආයෝජකයන් දිරි ගැන්වීම.
    (4) වෙළඳපොල තත්ව මත මිල තීරණය වීමට ඉඩ හැරීම.

20. ගැටුම් නිරාකරණයට මැදිහත්කරුවකු තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ යුතු කරුණක් වන්නේ,
    (1) දෙපාර්ශයටම බලපෑම් එල්ල කරන පුද්ගලයෙකු වීම.
    (2) තමාගේ විසඳුම් අන් අය මත පටවන්නෙකු වීම.
    (3) ආගමික ස්ථානයක හැදුනු වැඩුනු පුද්ගලයෙකු වීම.
    (4) දෙපාර්ශවයම පිළිගන්නා අපක්ෂපාතී පුද්ගලයෙකු වීම.

21. ''නීතිය යනු රාජ්‍ය විසින් ක්‍රියාවට නංවනු ලබන අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳ පද්ධතියකි.'' මෙය ප්‍රකාශ කළේ කවුරුන් විසින්ද ?
    (1) T. H. ග්‍රීන් විසිනි.
    (2) ජෝන් ඔස්ටින් විසිනි.
    (3) ගානර් විසිනි.
    (4) අරිස්ටෝටල් විසිනි.

- **පහතින් දැක්වෙන්නේ ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජයක් බිහිවීමට තුඩුදුන් පුද්ගල සාධක සමූහයකි. ඒවා අධ්‍යනය කොට ප්‍රශ්න අංක 22 සහ 23 ට පිළිතුරු සපයන්න.**

| | | | |
|---|---|---|---|
| A | විජය කුමරු ඇතුළු පිරිස | D | භද්දකඤ්චානා ඇතුළු පිරිස |
| B | සේන ගුත්තික ඇතුළු පිරිස | E | බටහිර යුරෝපා ජාතීන් |
| C | පාණ්ඩු පාරින්ද ඇතුළු පිරිස | F | පඩුවස්දෙව් ඇතුළු පිරි |

22. සංක්‍රමණ ස්වරූපයෙන් පැමිණි පසුව සමාජයට එකතු වූ අවස්ථා දැක්වෙන පිළිතුරු කාණ්ඩය කුමක් ද?
    (1) ABC (2) BCD (3) ADE (4) ADF

23. ආක්‍රමණ ස්වරූපයෙන් පැමිණි පසුව සමාජයට එකතු වූ අවස්ථා දැක්වෙන පිළිතුරු කාණ්ඩය කුමක් ද?
    (1) BCD (2) BCE (3) ACD (4) ACE

24. සිවිල් හා දේශපාලන අයිතිවාසිකමක් නොවන්නේ මින් කුමක් ද?
    (1) සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය.
    (2) ගමනාගමනයට ඇති අයිතිය.
    (3) පෞද්ගලික දේපල දැරීමට ඇති අයිතිය.
    (4) නියෝජිතයක් තෝරා ගැනීමට ඇති අයිතිය.

25. මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය සම්මත කර ගැනීමට බලපා ආසන්නතම හේතුව වූයේ,
    (1) පළමු වන ලෝක යුද්ධය.
    (2) දෙවන ලෝක යුද්ධය.
    (3) ඉංග්‍රීසි විප්ලවය.
    (4) ප්‍රංශ විප්ලවය.

26. ප්‍රථමයෙන් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස් ධූරයක් ඇති කළේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ද?
    (1) 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය.
    (2) 1947 සෝල්බරී ප්‍රතිසංස්කරණය.
    (3) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව.
    (4) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව.

27. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව රටේ සේනාධිනායකයා වන්නේ,
    (1) යුධ හමුදාපතිය. (2) ජනාධිපතිය. (3) නාවුක හමුදාපතිය. (4) අගමැතිය.

28. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක වැඩිම ප්‍රමාණයක් අයත් වන පළාත කුමක් ද?
    (1) උතුරු පළාතය.
    (2) බස්නාහිර පළාතය.
    (3) නැගෙනහිර පළාතය.
    (4) මධ්‍යම පළාතය.

29. අභියාචනාධිකරණයේ ප්‍රධනියා වන්නේ,
    (1) ජනාධිපතිය.
    (2) අග්‍රවිනිශ්චයකාරවරයාය.
    (3) නීතිපතිය.
    (4) සභාපතිවරයාය.

30. පහත දැක්වෙන්නේ ගැටුම් නිරාකරණයේ දී පුද්ගලයෙකු සතු විය යුතු ගුණාංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A නිර්මාණාත්මක චින්තනය. B සවන් දීම.

C යුතුකම් ඉටු කිරීම. D අන් අයට ගරු කිරීම.

E ඵලදායී සන්නිවේදනය.

(1) ABC (2) ADC (3) BDE (4) BCD

31. ප්‍රජාතන්ත්‍රවාදී රටක පරමාධිපත්‍ය බලයේ හිමිකරුවා වන්නේ,

(1) ජනාධිපතිය. (2) ආණ්ඩුවයි. (3) ජනතාවයි. (4) අමාත්‍ය මණ්ඩලයයි.

32. පළාත් සභාවක නාමික විධායකයට අයත් කාර්යයන් කරනු ලබන්නේ,

(1) මහ ඇමති විසිනි. (2) ආණ්ඩුකාරවරයා විසිනි.

(3) සභාපති විසිනි. (4) ලේකම් විසිනි.

33. විසිරී ඇති නිෂ්පාදන සාධක එකතු කර නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මෙහෙවීම.

(1) නිෂ්පාදනය වේ. (2) බෙදාහැරීම වේ.

(3) ව්‍යවසායකත්වය වේ. (4) වෙළඳාම වේ.

34. නීතිපති තුමාගේ මූලික බලතල යටතට අයත් වන්නේ,

(1) ප්‍රමාණවත් සාක්ෂි නොමැති විට විත්තිකරුවන් නිදහස් කිරීමට ජනාපධිතිට උපදෙස් දීම.

(2) මහේස්ත්‍රාත්වරයා නිදහස් කළ විත්තිකරුවන්ට එරෙහිව යළි නඩු පැවරීම.

(3) මරණ දඬුවම නියම වූ අයෙකුට සමාව දීම.

(4) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පවත්වනු ලබන නඩු වල දී පාර්ශවකරුවකු ලෙස පෙනී සිටීම.

35. බහු සංස්කෘතික සමාජයක් තුළ දක්නට ලැබෙන මූලිකම ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) විවිධ සංස්කෘතීන් වලට අයත් පුද්ගලයන් එකම සමාජයක ජීවත් වීම.

(2) එකම සංස්කෘතියට අයත් පුද්ගලයන් එකම සමාජයක ජීවත්වීම.

(3) විවිධ සංස්කෘතීන් වලට අයත් පුද්ගලයන් වෙන වෙන ම වෙනස් පරිසරවල ජීවත් වීම.

(4) එක රටක එක් ජාතියක් බැගින් ජීවත් වීම.

36. බ්‍රිතාන්‍ය පාලන සමය තුළ ශ්‍රී ලංකාවේ ඉහළම උසාවියකින් දෙනු ලැබූ තීන්දුවකට එරෙහිව අභියාචනා ඉදිරිපත් කළ හැකි වූයේ,

(1) ශ්‍රේෂ්ඨාධිකරණයටයි. (2) අභියාචනාධිකරණටයි.

(3) මහාධිකරණයටයි. (4) බ්‍රිතාන්‍යයේ රාජාධිකරණයටයි.

37. වර්තමානයේ ලොව බොහෝ රටවල් තනි ආර්ථිකයක් ලෙස ඒකාබද්ධ ව කටයුතු කිරීමේ ප්‍රයත්නයක නිරත වෙමින් සිටි බව පෙනෙන්ට ඇත. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ,

(1) සන්නිවේදනයේ දියුණුවයි. (2) ගෝලීයකරණයේ බලපෑමයි.

(3) ප්‍රවාහනයේ දියුණුවයි. (4) විදේශ වෙළඳාමේ දියුණුවයි.

38. බරපතල අපරාධ සම්බන්ධයෙන් නඩු විසඳීමේ බලය හිමි වන්නේ,

(1) ශ්‍රේෂ්ඨාධිකරණයටයි. (2) මහාධිකරණයටයි.

(3) අභියාචනාධිකරණයටයි. (4) දිසා අධිකරණයටයි.

39. නීතියේ ආධිපත්‍ය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) නීතිය ඉදිරියේ සියලුම දෙනා සමානයන් නොවේ.

(2) සෑම පුද්ගලයෙක් ම නීතියට යටත් නොවේ.

(3) රටේ පවත්නා නීතිය බලයට පත් වන බලධාරීන්ට වෙනස් කළ හැක.

(4) නීතියේ උත්තරීතරභාවයට අනුව රට පාලනය කරයි

40. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් සේවක අයිතිවාසිකමක් නොවන ප්‍රකාශය තොර්න්න.

(1) ආයතනයේ අරමුණු අනුව වැඩ කිරීම. (2) සේවක සුරක්ෂිතතාවය ලබා ගැනීම.

(3) පැය අටක සේවා කාලයක් තුළ වැඩ කිරීම. (4) නිවාඩු ලබා ගැනීමට ඇති හැකියාව.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

**11 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය**

නම/ විභාග අංකයඃ

## II - කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

01. (i) ඡන්ද කොට්ඨාස අනුව නියෝජිතයන් තෝරා ගැනීම නිසා ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න.

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග 02 ක් නම් කරන්න.

(iii) භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදාගන්නා ශිල්පීය ක්‍රම දෙක නම් කරන්න.

(iv) ගැටුම් ඇතිවන මූල දෙකක් ලියන්න.

(v) නීතියේ මූලාශ්‍ර දෙකක් ලියන්න.

(vi) මානව අයිතිවාසිකම් බෙදා දැක්විය හැකි කොටස් දෙක ලියන්න.

(vii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ සඳහන් මූලධර්ම 02 ලියන්න.

(viii) පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන 02 ක් ලියන්න.

(ix) ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට ගෙන ඇති පියවර 02 ක් ලියන්න.

(x) ඩොනමෝර් ආණ්ඩු ප්‍රතිසංස්කරණ යටතේ සිටි රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙන් දෙදෙනෙකු නම් කරන්න.

(ලකුණු 2 බැගින් × 10 = ලකුණු 20 යි.)

02. ''ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ මැතිවරණ මගින් ජනතාවගේ බහුතර කැමැත්ත අනුව ආණ්ඩු තෝරා පත්කර ගනියි.''

(i) ආණ්ඩු ක්‍රමවල ස්වරූප දෙක නම් කරන්න. (ල. 02)

(ii) සන්ධීය රාජ්‍යවල ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(iii) (A) ආණ්ඩුව සමන්විත වන ආයතන තුනෙන් දෙකක් නම් කරන්න. (ල. 02)

(B) ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 03)

03. ''රටේ අවශ්‍යතා අනුව නීති පනවන බැවින් දේශීය නීතිය රටකින් රටකට වෙනස් වේ.''

(i) දේශීය නීතියේ ප්‍රභේද 02 ක් ලියන්න. (ල. 02)

(ii) නීතියේ ගුණාංග 03 ක් ලියන්න. (ල. 03)

(iii) (A) 1978 ව්‍යවස්ථාවට සහ අධිකරණ සංවිධාන පනතට අනුව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ඉහළ ම අධිකරණ ආයතන දෙක නම් කරන්න. (ල. 02)

(B) ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 03)

04. ''එදිනෙදා ව්‍යවහාරය තුළ නිරන්තරයෙන් ම ඇසෙන පදයක් ලෙස ගැටුම් හැඳින්විය හැක.''

(i) ප්‍රධාන වශයෙන් ගැටුම් වරග කළ හැකි ක්ෂේත්‍ර දෙක ලියන්න. (ල. 02)

(ii) ජොහාන් ගැල්ටුන්ගේ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතියේ අවස්ථා තුන ලියන්න. (ල. 03)

(iii) (A) මනසේ සාමය ඇතිකර ගැනීම සඳහා යොමුවිය හැකි අංශ 02 ක් ලියන්න. (ල. 02)

(B) ඉන් එකක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 03)

05. ''වර්තමානයේ මුදල් මධ්‍ය කොටගෙන භාණ්ඩ හුවමාරු කර ගනියි.''

(i) ප්‍රාග්ධන භාණ්ඩ 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) නිෂ්පාදන සාධක 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) (A) රට අභ්‍යන්තරයේ කරන වෙළඳාමෙහි දැකිය හැකි කොටස් 02 නම් කරන්න. (ල. 02)

(B) ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 03)

06. ''යන පාලනය රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකි.''

(i) ''යහ පාලනය'' කෙටියෙන් හඳුන්වන්න. (ල. 02)

(ii) යහ පාලනයක මූලික ගුණාංග 03 ක් ලියන්න. (ල. 03)

(iii) (A) බහු සංස්කෘතික ජන සමාජයක යහ පාලනය ක්‍රියාත්මක වීමෙන් ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියන්න. (ල. 02)

(B) ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 03)

07. ''අයිතිවාසිකම් භුක්ති විඳිමින් තම යුතුකම් ඉටු කිරීම පුරවැසියන්ගේ වගකීමකි.''

(i) මානව අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ඇති වූ වැදගත් ඓතිහාසික අවස්ථා 02 ක් ලියන්න. (ල. 02)

(ii) ළමා අයිතිවාසිකම් කඩවන අවස්ථා 03 ක් ලියන්න. (ල. 02)

(iii) (a) පාසල් ශිෂ්‍යයකු ලෙස අයිතිවාසිකම් භුක්ති විඳින ඔබ විසින් ඉටුකළ යුතු යුතුකම් 02 ක් ලියන්න. (ල. 02)

(b) ඉන් එක් යුතුකමක් පිළිබඳ විස්තර කරන්න. (ල. 03)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(1) | 4 -(4) | 5 -(2) | 6 -(1) | 7 -(3) | 8 -(4) | 9 -(1) | 10 -(2) |
| 11-(4) | 12 -(2) | 13 -(3) | 14 -(2) | 15 -(3) | 16 -(4) | 17 -(1) | 18 -(3) | 19 -(2) | 20 -(4) |
| 21-(1) | 22 -(4) | 23 -(2) | 24 -(3) | 25 -(2) | 26 -(4) | 27 -(2) | 28 -(1) | 29 -(4) | 30 -(4) |
| 31-(3) | 32 -(2) | 33 -(3) | 34 -(4) | 35 -(1) | 36 -(4) | 37 -(2) | 38 -(2) | 39 -(4) | 40 -(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i)
- ★ ඡන්ද කොට්ඨාසයට වග කියන නියෝජිතයෙකු තෝරා ගැනීමට හැකි වීම.
- ★ ප්‍රාදේශීය සංවර්ධනයට ඉඩ ප්‍රස්තා සැලසීම.
- ★ ප්‍රාදේශීය මට්ටමෙන් නායකයන් බිහි කර ගැනීමට අවස්ථාව ලැබීම.

(ii) මහ නගර සභා, නගර සභා, ප්‍රදේශීය සභා

(iii) ප්‍රාග්ධන සූක්ෂම ක්‍රමය හා ශ්‍රම සූක්ෂම ක්‍රමය.

(iv) වාර්ගිකත්වය, දේශපාලනය, ආගමික මතවාද, සමාජ ආර්ථික තත්ත්වය.

(v) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, අධිකරණ තීන්දු, සිරිත් විරිත්, ආගම, විවිධ අණ පනත්, නීති විශාරදයින්ගේ මත

(vi) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්, ආර්ථික සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම්

(vii)
- ★ ළමයාගේ උපරිම යහපත.
- ★ සහභාගීත්වය.
- ★ පැවැත්ම සහ සංවර්ධනය.
- ★ වෙනස් කොට නොසැලකීම.

(viii)
- ★ මහජන උපයෝගීතා සේවාවන් පහසුවෙන් ලබාගත හැකි වීම.
- ★ නායකයින් බිහිවීමට පසුබිම සැකසීම.
- ★ සංවර්ධන කටයුතු වේගවත් වීම.
- ★ සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සංවිධානාත්මකව පවත්වාගෙ යාම.
- ★ නාගරික හා ග්‍රාමීය ජනතාවගේ විවේකය, විනෝදය සහ දැනුම ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා පහසුකම් සැපයීම.

(ix)
- ★ විනිශ්චයකාරවරුන් පත් කිරීම.
- ★ විනිශ්චයකාරවරුන් ඉවත් කිරීම.
- ★ විනිශ්චයකාරවරුන්ගේ වැටුප්
- ★ වෙනත් තනතුරු පිළි නොගැනීම.
- ★ අනවශ්‍ය මැදිමත් වීම් පාලනය කිරීම.
- ★ අධිකරණ සේවා කොමිෂම පිහිටුවීම.

(x) රාජ්‍ය ලේකම, මුදල් ලේකම්, නීති ලේකම්

02. (i) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හා ජනාධිපති ආණ්ඩු ක්‍රමය

(ii)
- ★ ලිඛිත ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථාවක් පැවතීම.
- ★ මධ්‍යම ආණ්ඩුවේ සහ ප්‍රාන්ත ආණ්ඩු සතු බලතල පැහැදිලිව ව්‍යවස්ථාව තුළ දක්වා තිබීම.
- ★ ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේ බලලය ඉහළ අධිකරණයට පැවරීම.
- ★ දෙවන මණ්ඩලයක් පැවතීම.

(iii) (A) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය

(B) අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

03. (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, අපරාධ නීතිය, සිවිල් නීතිය

(ii)
- ★ යුක්ති සහගත සහ සාධාරණ වීම.
- ★ පොදු සමාජ යහපත අරමුණු කොටගෙන පැවතීම.
- ★ නිරවුල් හා පැහැදිලි වීම.
- ★ යුක්ති සහගත හා සාධාරණ වීම........ යනාදිය.

(iii) (A) ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය

(B) විස්තරයට ලකුණු ලබා දෙන්න.

04. (i) අභ්‍යන්තර ගැටුම් හා අන්තර්ජාතික ගැටුම්
(ii) සන්දර්භය, චර්යාව, ආකල්ප
(iii) (A) ⋆ ආගමික වතාවත් කෙරෙහි යොමු වීම.
⋆ මනෝ විද්‍යාත්මක අභ්‍යාසය මගින්
⋆ උපදේශනය මගින්
⋆ ස්වභාවික පරිසරය නිරීක්ෂණය කිරීම.
(B) විස්තරයට අදාළ ලකුණු ලබා දෙන්න.

05. (i) යන්ත්‍රසූත්‍ර, ගොඩනැගිලි, වාහන
(ii) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය
(iii) (A) තොග වෙළඳාම හා සිල්ලර වෙළඳාම
(B) අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

06. (i) ආර්ථික හා මානව සම්පත් වලින් හිඟයක් නොවුනද සමහර රටවල ආර්ථික සංවර්ධනය මන්දගාමී වීම සහ සමාජ සාධාරණත්වය බිඳ වැටීම වැනි ප්‍රශ්නවලට බලපා ඇති හේතු සාධක මොනවාද යන්න පිළිබඳව සාකච්ඡා කිරීමේ දී පැන නගින සංකල්පයක් ලෙස යහ පාලනය හැඳින්විය හැක.
(ii) ⋆ දූෂණයෙන් හා වංචාවෙන් තොර රාජ්‍ය පාලනය
⋆ නිදහස හා සාධාරනත්වය තහවුරු වීම.
⋆ මාධ්‍ය නිදහස ආරක්ෂා වීම.
⋆ නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම.
⋆ විනිවිද භාවයෙන් කටයුතු කිරීම.
⋆ ව්‍යවස්ථානුකූලවාදය ආරක්ෂා කිරීම.............. යනාදිය
(iii) (A) ⋆ විවිධ ජන කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු වේ.
⋆ එකිනෙකාට ගරු කිරීමට හුරු වේ.
⋆ විනිවිදභාවයෙන් කටයුතු කරයි.
⋆ නීති ගරුක පුරවැසියන් ලෙස ජීවත් වේ.
⋆ සහජීවනයෙන් ජනතාව කටයුතු කරයි.
⋆ ජනතාව අතර අවබෝධය පුළුල් වේ.
(B) අදාළ විස්තරයට ලකුණු ලබා දෙන්න.

07. (i) ⋆ මැග්නා කාර්ටා ගිවිසුම (බ්‍රිතාන්‍යයේ)
⋆ අයිතිවාසිකම් පිළිබඳ පනත
⋆ ඇමරිකානු නිදහස් ප්‍රකාශනය
⋆ ප්‍රංශ විප්ලවය හා රුසියන් විප්ලවය
(ii) ⋆ ළමයින් අපයෝජනයට ලක් වීම, පාසල් නොයැවීම.
⋆ ළමයින් ශ්‍රමිකයන් ලෙස යොදවා ගැනීම.
⋆ දරුවන් පැහැරගෙන යාම, වධ හිංසාවලට යොමු නීම
(iii) (A) ⋆ අධ්‍යාපන කටයුතු හොඳින් කරගෙන යාම, විනය ගරුක වීම.
⋆ පාසලේ සම්ප්‍රදායයන් හා සම්පත් ආරක්ෂා කිරීම.
⋆ ගුරුවරුනට කීකරු වීම.... යනාදිය
(B) අදාළ පිළිතුරට ලකුණු ලබා දෙන්න.